# පුරප්පාඩු දැන්වීමයි

## මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීම

මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා පත් කිරීමට ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයට අයත් දැනට රාජ්‍ය සේවයෙහි හා පළාත් රාජ්‍ය සේවයෙහි, සේවයේ නියුතු ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ (කෘෂි සංවර්ධන ධාරාවට අයත්) නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. <u>සුදුසුකම්</u>**

I. ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ (කෘෂි සංවර්ධන ධාරාවට අයත්) නිලධාරියෙක් විය යුතුයි.
II. දැනටමත් රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධරයන් වෙතින් පමණක් අයදුම්පත් කැඳවන බැවින් වයස් සීමාවක් අදාල නොවේ.
III. අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුයි.
IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුයි.

02. <u>බඳවා ගැනීමේ ක්‍රමය</u>

මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ (කෘෂි සංවර්ධන ධාරාවට අයත්) අයදුම්කරුවන් අතුරින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකදී, මධ්‍යම රජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබ ඇති ලකුණු පරිපාටියක් අනුව ලකුණු පිරිනමා, ලබා ගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම සිදු කරනු ලැබේ.
(අනුමත ලකුණු නිර්ණායක www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙහි පළ කර ඇත.)

**සටහන:** සුදුසුකම් සනාථ කෙරෙන සියලුම සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය.

**03. <u>අයදුම්පත් ඉදිරිපත් කිරීම</u>**

සියලුම අයදුම්පත් විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර 2023.07.14 වන දින හෝ ඊට පෙර ලැබෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ අදාළ අමාත්‍යාංශ ලේකම් මගින් (පළාත් සභාවට අන්තර්ග්‍රහණය වූ නිලධරයෙකු නම් ඔබගේ අයදුම්පත පළාත් අමාත්‍යාංශ ලේකම් හා ප්‍රධාන ලේකම් ගේ නිර්දේශ සහිතව යොමු කළ යුතුය) **“ ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර ”** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ **“ මධ්‍යම පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම ”** යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැති වීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව භාර ගනු නොලැබේ.
(ආදර්ශ අයදුම්පත්‍රය www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකිය)

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

මෙම දැන්වීමේ සිංහල ,දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර, යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

මෙයට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

2023 ජූනි මස 19 වැනි දින.
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

කුමුදිනී එස්.ප්‍රේමචන්ද්‍ර,
ලේකම්,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.